## කිතුනු ගී – ඇතුල්වීමේ ගී– 9

### 9 – සියල් ජනයනේ

සියල් ජනයනේ තොපගේ – දෙවිඳු වඩින්නේ
නගා ඔහොයියා හඬගා
අත් පොළොසන් දෙව් රජුනට – දෙවිඳු වඩින්නේ

පිළිගන්නේ තුටු ගොස දී දෙවියන් තොපගේ
අපට ඉහළ වැජැඹෙති ඒ සමිඳරුවාණෝ
බියට සුදුසු තරම් වෙතියි ඔවුන් වහන්සේ
මුළු ලොවටැ මැ ඒ සුරිඳෝ එක නා පල්ලෝ

අපට ඔතැ ලෙසැ රජයන් හිලැ කැරැවූවෝ
විදෙසි දනන් අප පාමුලැ ඔබා නැමෙව්වෝ
උරුම කොටස විසින් අපව වෙසෙසා ගත්තෝ
ජකෝබු පෙළ නම පියකර කෙරේ පැහැදුනෝ

සියල් ලොවේ රජ්ජුරුවෝ පරම දෙවිසුරෝ
එක නිනාදේ හඬ නංවව් ගයා පසස ගී
විදැ දනා කෙරේ පවා රජ වෙති දෙවිඳෝ
හේලි බැවින් සැදි සුරිඳෝ අසුන් අරන්නෝ